# මෙපුර අවුරුදු

## පන්හිඳයි පින්සලයි

සිසිර දිසානායක

"සන්නසට අවුරුදු හයකුත් පිරුණා." අසෝක සුබසිංහ කතෘ මහත්තයා කිව්වා.

"හැබෑ නේන්නං. සන්නස පටන් ගත්තෙ අවුරුදු මාසෙනෙ"

පන්හිඳට ඒ බව මතක් වුණේ අසෝක මහත්තයා මතක් කළාමයි. මේ දෙන්නා මේ කයියකට වැටිලා උන්නෙ උතුරු මෙල්බර්න් වල මිතුරු කණ්ඩායමක් තෝමස් ටවුන්වල සංවිධානය කරලා තිබ්බ අවුරුදු උත්සවයකදියි. එදා උත්සවය මෙහෙයෙව්වෙ ශ්‍රීනාත් මද්දුමගේ ජගත් ජේ එදිරිසිංහ, මහත්තුරු. කාලගුණයත් හොඳ වුණ හන්දා ඒ හැන්දෑව අවුරුදු කෑම බීම, කෙළි සෙල්ලං, විහිලු තහළු අවුරුදු සින්දු මැද ගෙවුණ සුන්දර හැන්දෑවක් වුණා. උත්සවයෙන් පස්සෙ පැදුරු සාජ්ජයකුයි, ආප්ප රාත්‍රියකුයි තිබුණා.

අවුරුදු කාලෙට පන්හිඳට වගේම පැන්සලටයි පින්සලටයි දෙන්නාටත් හරියට වැඩ. තුන් දෙනා එක්ක මේ අවුරුදු උත්සවවලට සහභාගි වෙන්නෙ හරි සතුටින්. පහුවදා උදේ වරුව ගතවුණේ බ්‍රන්ස්වික් සිංහල භාෂා ඉස්කෝලේ අවුරුදු උත්සවය තිබුණ ග්ලැඩ්ස්ටන් පාර්ක් ද්විතීක පාසැලේ.

"මේ දරුවෙක් ඇඳලා තියෙන චිත්‍රය දැක්කම ආරාධනාව මඟ අරින්න හිතෙන්නෙ ම නෑ." කුඩා දරුවෙක් පාට පැන්සල් වලින් ඇඳපු චිත්‍රයකිනුයි ආරාධනා පත්‍රය සකස් කරලා තිබුණෙ. පින්සලට ඒකට හරියට හිත ගිහින්. අවුරුදු වැඩසටහන් විස්තරය තියෙන පත්‍රිකාවත් ලක්බිත ප්‍රනාන්දු මහත්තයා අපූරුවට නිර්මාණය කරලා තිබුණා. ඒකත් අවුරුදු චිත්‍රවලින් ම පිරිලා. ඒ වගේම අවුරුදු උත්සවය තිබුණ තාවකාලික වේදිකාවේ පසු තලය හැඩ වෙලා තිබුණෙත් විශාල අවුරුදු චිත්‍රයකින්. ඒක ඇඳලා තියෙන්න චින්තක ලියනරත්න මහත්තයා අවුරුදු උත්සවය පටන්ගත්තෙ සිංහල භාෂා ඉස්කෝලේ ප්‍රධාන අනුශාසක ගරු දිගාමඩුල්ලේ විමලානන්ද ස්වාමීන් වහන්සේ පිරිස පන්සිල් සමාදන් කරවලා කරපු දේශනයෙන් පස්සෙයි. ඊට පස්සෙ කරන්න යොදාගෙන තිබුණ වැදගත්කම කාරිය තමයි ගුරුවරුන්ට, වැඩිහිටියන්ට බුලත් දෙන එක. දරුවෝ ඒ ඒ අයගේ පන්ති කාමරවලට ගිහින් තමුන්ගේ ගුරුවරුන්ට බුලත් දීලා වැන්දා. ඊට පස්සෙයි මේ අය හැමෝම එකතුවෙලා කැවිලි පෙවිලි සප්පායම් වෙන්න ආවෙ. ඒකට ලොකු කැවිලි මේසයක් සූදානම් කරලයි තිබුණෙ.

හැම උත්සවයකම වාගේ දකින්න ලැබුණ බැළුම් පිපිරවීම, සංගීත පුටු තරඟය, කණා මුට්ටිය බිඳීම, අලියාට ඇස තැබීම, හැන්ද උඩ දෙහි ගෙඩිය තියාගෙන දිවීම, පොල් ගෑම, ගෝනිවල බැස දිවීම, බනිස් කෑම, තුන් පා දිවීම, විකට ඇඳුම් තරඟය, සැඟවුණ අමුත්තා සෙවීම, වට්ටක්කා ගෙඩිය් ඇට ගැනීම, කඹ ඇදීම වාගේ තරගවලින් මේ අවුරුදු උත්සවය පිරුණා. ඒ වගේම හාවුන් පැනීම, සීනි බෝල ඇහිඳීම, බාධක දිවීම, කණාට කිරි කැවීම, අත්ලෙන් අත්ලට වතුර පිරවීම, ඇඬීමේ තරඟය, හිනා වීමේ තරඟය වාගේ අපට වැඩිය හුරු නැති තරඟත් පොඩිත්තන්ට සූදානම් කරලා තිබුණා.

පන්, පින්, පැන් තුන්දෙනා හවස් ජාමේ සහභාගි වුණේ කිස්බරෝ අවුරුදු උත්සවයට. දෙමව්පියන්ගේත් ආධාරය ඇතිව මේ පාර උත්සවය ගුරුවරුන් සරුවට සංවිධානය කරලා තිබුණා. ආරාධිත අමුත්තෝ පහන දැල්වූවාට පස්සේ ගරු නාඔටුන්නේ විජිත ස්වාමීන් වහන්සේ ඇතුලු ස්වාමීන් වහන්සේලා කීප නමකගේ මූලිකත්වයෙනුයි උත්සවය පැවැත්වුණේ. උතුරු මෙල්බර්න් අවරුදු උත්සවය පැවැත්වුණේ. උතුරු මෙල්බර්න් අවරුදු උත්සවයට ඒ ප්‍රදේශයේ මන්ත්‍රීවරිය සහභාගි වුණා වගේම මේ උත්සවයටත් ඩැංඩිනොං නගරාධිපතිවරයා ඇතුළු සිංහල නොවන ආරාධිතයින් කීප පොළක් ම සහභාගි වුණා. මේ අවුරුදු උත්සවයේ විශේෂත්ව දෙකක් දකින්නට තිබුණා. උත්සවය මෙහෙයෙව්වෙ... සඳුනි කාලිංගමුදලි තරුණ ගුරු මෙනෙවියක් පමුදිතා කුලරත්න ගුරු මහත්මියත් වුණ එක එයින් එකක්.

අපේ බවලත් උදවිය අවුරුදු උත්සව මෙහෙයවනවා දකින්න ලැබෙන්නෙ අඩුවෙන්. අනික් දේ තමයි සිංහල අවුරුද්ද ගැන චිත්‍ර තරගයක් පවත්වපු එක.

"මෙල්බර්න් නුවර අය දැන් චිත්‍ර ගැනත්



උනන්දුයි."

පින්සල පන්සලේ ඉදිකරන වෙසක් තොරණට මංගලා කරුණාරත්න නෝනා මහත්තයා ඇඳපු චිත්‍ර රස විඳින ගමන් කිව්වේ බොහොම උජාරුවට.

"මීට අවුරුදු හයකට කලින් පටන් ගත්ත සන්නස පත්තරේට අපි මුලින් ම ඇන්දෙ සිංහල අවරුදු චිත්‍රයක්නේ...." පින් ඒ අතීතය මතක් කළා.

හැම තැනම වාගේ තම තමන්ට පුළුවන් විදියට අවුරුදු උත්සව සංවිධානය කරලා තිබුණා. තම තමන්ගෙ කණ්ඩායම් වෙන් වෙනම එක්වෙලා විනෝද වෙන අතරේ අපේ අය දහ දාහක් විතර එකතු වුණ මහා සිංහල අළුත් අවුරුදු උත්සවය පුරුදු විදියට ශ්‍රී ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයේ ආදි ශිෂ්‍ය මහත්තුරු සංවිධානය කරලා තිබුණා. මේ පාරත් උත්සවය තිබුණේ " ඩැංඩිනොං ෂෝ ග්‍රවුන්ඩ්ස්" පිට්ටනියේ. අවුරුදු ක්‍රීඩා අතරට එකතු වුණ ජන ගී ගායනා තරඟය, විකට ඇඳුම් තරඟය වාගේ තරගවලටත් හුඟ දෙනෙක් ඉදිරිපත් වුණා. පුරුදු විදියට අවුරුදු කුමාරි තේරීමේ තරගනම් තිබුණෙ නෑ මට හිතෙන්නෙ. සිංහල විදියට සරම්, කමිස ඇඳලා ආපු පිරිසත් ටිකක් අඩුයි. සීත කාලේ පටන් අරන් හන්දා වෙන්න ඇති. අනික සරම් ඇඳගෙන තරඟවලට සහභාගී වෙන්නත් අමාරුයිනේ. විශාල තිරයක දර්ශන ඉදිරිපත් කරපු එක මේ පාර උත්සවයට අළුතින් එකතු වුණ දෙයක් වුණා. දැන්වීම් පළ කරන්න වගේම දර්ශනගත කරපු අවුරුදු සින්දු ප්‍රචාරය කරන්නත් මේ තිරය පාවිච්චි කරපු එක මෙහේ අවුරුදු උත්සවවලට අලුත් දෙයක්.

හැම අවුරදු උත්සවයක ම වාගේ නියම සිංහලකම රැඳුන අවුරුදු ගීත ප්‍රචාරය වෙනවාත් අහන්න ලැබුණා. සිංහලකමට හුරු රබර්, බෙර, උඩැක්කි වාදනය වුණ ඒ සින්දුවල ඉන්දියාවට හුරු තබ්ලාව වාදනය වුණේ නෑ.

පසුගිය වතාවෙ වගේ ම මේ අවුරුද්දේත් ලංකාවෙ ජාතික රූපවාහිනියේ ප්‍රධාන අවුරුදු වැඩ සටහනට ගීත ඉදිරිපත් කළේ විශාරද වසන්තා මධුරාංගනී ගායිකාවගේ ජන ගී කණ්ඩායම. වසන්තා ලයනල් රන්වල මහතැන්ගේ ගෝලයෙක්. ඒ අවුරුදු වැඩසටහනට මේ කණ්ඩායම රඟ පාමින් ඉදිරිපත් කරපු ගීත කීපයක් ම පන්හිඳ අතින් ලියවුණ ගීත. අවුරුදු කාලෙ ලංකාවට යනකොට ගුවන් යානයේ දී පන්ට ලිය වුණ ගීතයක් මේ ගීත අතරට එකතු වුණා. ඒ පද ටික මේ විදියට ලියලා තියන්න හිතුවා. මේ ගීතයේ වෙනස තමයි වැඩිහිටි, මාමාත්, නැන්දාත් කියන කොටස් ඇත්තට ම ගායනය ගමේ වයසක වැඩිහිටි මාමා කෙනෙකුයි නැන්දා කෙනෙකුයි කියපු එක.

පිරිස: ඉරුදෙව් රැකවරණින්
සඳු දෙව් කරුණාවෙන්

ගායිකාව: පෝය පෝයෙන් ගෙවී ආයෙම

පිරිස: අවුරුදු ඇවිදිල්ලා

ගායිකාව: සතුටු වෙන්නට නැකත් අරගෙන
කාට කාටත්
පිරිස: අවුරුදු ඇවිදිල්ලා

වැඩිහිටි මාමා: තෑගි බෝග බරට අරන්
නෑ මිතුරන් බැහැ දකින්න
කවුද කෙනෙක් ඇවිත් බොලං
සිදාදියෙන් අපි බලන්න

ගැහුණු: කැවිලි පෙවිලි පුදමු ඉතින්
සප්පායම් වෙලා යන්න

පිරිමි: ගමේ අපේ කෙළි සෙල්ලම්
පෙන්නමු අපි හිත පිරෙන්න

පිරිස: වාරම් සද්දෙට පැදලා රන් ඔන්චිල්ල
රතිනඤ්ඤා සද්දෙට රබානෙ පද
පුරපල්ලා !

වැඩිහිටි නැන්දා: අතන මෙතන නොයා ඉඳින්
නොනගතයේ කල් මරන්
පන්සල් යමු න්ද බොලං
පිනක් දමක් කරන් එන්න

පිරිමි: බුලත් හුරුළු දි දි ඉතින්
වැඩිහිටියන් සමා ගන්න
නානු අරන් එමු නැන්දේ
හිස තෙල් ගා දිය නාන්න

පිරිස: කොවුලනි ඇවිදින් අවුරුදු ගී ගයපල්ලා
බෙල්ලනි පංචා පෙත්තේ අය ගැනපල්ලා

ගායිකාව: දළදා රැකවරණින්
ජය සිරිමා හිමි සරණින්

පිරිස: කිරි ඉතිරී

ගායිකාව: නිරෝගී සුවයෙන්
ආයු බෝ සේ වඩමින්

පිරිස: සැරදේවා !

අවුරුද්දේ - මේ අවුරුද්දේ
අවුරුද්දේ - ලැබූ මේ අවුරුද්දේ

**Land/House For Sale**

Battaramulla - Pelawaththa
Perera Mawatha,
Behind Overseas school

**15p square land with a house**
**For quick sale**

0777 701 118
0777 201 969